# බැංකු සැසඳුම් ප්‍රකාශය

## Bank Reconciliation Statement

බොහෝ ව්‍යාපාර සිය ව්‍යාපාරික ගණුදෙනු වර්තමානයේ බැංකු ජංගම ගිණුම් උපයෝගී කරගනිමින් සිදු කරයි. අදායම් රැස්කිරීමටත් , ගණුදෙනු පියවීමටත් වාණිජ බැංකු වල ජංගම ගිණුමක් විවෘත කරමින් චෙක්පත් භාවිතා කරමින් ගනුදෙනු කරනු ලැබේ.

මෙලෙස ජංගම ගණුම් පවත්වාගෙන යාම නිසා ව්‍යාපාරික ගනුදෙනු වඩා කාර්යක්ෂමව පවත්වාගෙන යාමේ හැකියාව ඇතිවීම හා වැරදීම් අවමකරගැනීම හා වංචා වලක්වා ගැනීමට ඇති හැකියාව මත මෙන්ම වඩා ආරක්ෂාකාරී ගනුදෙනු පියවීමක් කිරීමේ හැකියාව නිසාද ව්‍යාපාරිකයන් අතර බැංකු ජංගම ගිණුම් වඩාත් ජනප්‍රිය වී ඇත.

## බැංකු විස්තරය / බැංකු ප්‍රකාශනය

වාණිජ්‍ය බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යන ගිණුම් හිමියෙකුට බැංකුව සමඟ සිදුකරන ලද ගනුදෙනු පිළිබඳව විස්තරයක් ගිණුම්හිමියාගේ ඉල්ලීම පරිදි දෛනිකව , සතිපතා හෝ මාස්පතා බැංකුව විසින් ගිණුමේ ගනුදෙනු සිදුවූ ආකාරය දක්වමින් විස්තරයක් එවනු ලැබේ. බොහෝ විට වාණිජ්‍ය බැංකු මෙම ප්‍රකාශය / විස්තරය මාසිකව සෑම ජංගම ගිණුම් හිමියකුටම යවන අතර මෙම බැංකු ප්‍රකාශය තුල අදාල ගිණුම් හිමියා කාලසීමාව ඇතුලත සිය ජංගම ගිණුම සමඟ කල ගනුදෙනු ඇතුලත් වේ. මෙසේ කිසියම් කාලච්ඡේදයක් අවසානයේදී ජංගම ගිණුම් හිමියකුට තම බැංකුව විසින් අදාල කාලච්ඡේදය ඇතුලත ජංගම ගිණුම සමඟ කල ගනුදෙනු ඇතුලත් කර එවන ලද විස්තර ප්‍රකාශයක් බැංකු විස්තරය වේ.

## බැංකු ජංගම ගිණුම

වාණිජ බැංකුවක ජංගම ගිණුමක් ආරම්භකල ගනුදෙනුකරුවකු ජංගම ගිණුම් හිමියකු ලෙස හදුන්වන අතර ඔහුගේ නමින් ගිණුමක් විවෘත කර එය බැංකුව විසින් ද්විත්ව සටහන් ක්‍රමයට පවත්වාගෙන යයි. අදාල ජංගම ගිණුම් හිමියා විසින් හෝ ඔහු වෙනුවෙන් අදාල ගිණුමට ලැබෙන / තැන්පත් කරන මුදල් හා උපලබ්ධි වන චෙක්පත් , මුදල් ඇණවුම් , බැංකු අණකර , ණයවර ලිපි මුදල් යනාදිය බැංකුව බැරට සටහන් කරන අතර ගිණුම් හිමියා විසින් නිකුත් කරන චෙක්පත් හා බැංකුව අයකරන ගාස්තු ඊට හර කරයි.

## ව්‍යාපාරයක බැංකු ජංගම ගිණුමක් මඟින් පහත කාර්යයන්

- ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කිරීම
- ලැබීම් වෙනුවෙන් ලද චෙක්පත් තැන්පත් කිරීම
- මුදල් තැන්පත් කිරීම
- ව්‍යාපාරය විසින් නියෝග බැංකුව වෙත ( ස්ථාවර නියෝග ) නිකුත් කරමින් ගෙවීම් පියවීම
- ව්‍යාපාරයට වෙනත් ව්‍යාපාර වෙතින් ලැබිය යුතු මුදල් ඍජුව බැංකුව හරහා රැස්කිරීම ( ඍජු ප්‍රේෂණ )
- චෙක්පතක් නිකුත් කර මුදල් ලබා ගැනීම

මාසය අවසානවන විට මෙම ගිණුම තුලනය කරන අතර හර හා බැර ශේෂ ගළපනු ලැබේ. අනතුරුව සියළුම හර කිරීම් හා බැර කිරීම් ඇතුළුව මාසය අවසානයේ පවතින ශේෂයද සඳහන් කරමින් ගිණුම් හිමියා වෙත මාසික ප්‍රකාශනයක් තැපැල් කර එවනු ලබයි. එබැවින් බැංකු විස්තරය යනු සැබැවින්ම ජංගම ගිණුමේ සාරාංශයයි. එය ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන මුදල් පාලන ගිණුමේ ප්‍රති සටහනයි. බැංකු විස්තරයක ආකෘතියක් පහත පරිදි පෙන්වා දිය හැක.

| | |
|---|---|
| ගිණුම් අංකය:<br>ගිණුම් හිමියාගේ නම :<br><br>ලිපිනය : | බැංකුවේ නම :<br>ලිපිනය :<br>දුරකතන අංකය / ෆැක්ස් අංක :<br>ඉදිරියට ගෙනා ශේෂය: |

| දිනය | විස්තරය | හර කිරීම් | බැර කිරීම් | අවසාන ශේෂය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

උදාහරණ : 01

පහත සඳහන් තොරතුරු ඇසුරින් බැංකු ප්‍රකාශනයක් පිළියෙල කරන්න.

ව්‍යාපාර ඒකකය : සී/ස ලලාන් සමාගම

බැංකුව : ලංකා බැංකුව ගිණුම් අංකය : 000254512

2019 ජනවාරි මසට අදාල බැංකුවේ ගනුදෙනු සටහන් විස්තරක් පහත දැක්වේ.

| මූලික ලේඛනය | දිනය | ගනුදෙනු පිළිබඳ විස්තරය |
|---|---|---|
| | 1/1 | බැංකු විස්තරය අනුව ශේෂය රු.250,000 |
| | 1/5 | භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ගෙව්වා රු. 12.000 ( චෙක්පත් අංකය 00546 ) |

JMC vLearning "your virtual learning partner"

| | | |
|---|---|---|
| | 1/7 | භාණ්ඩ මිලට ගැනීම් රු. 45,000 ( චෙක්පත් අංක 00547 ) |
| | 1/9 | ණයගැති ලැබීම් රු. 80,000 |
| | 1/10 | ගෙවල් කුලී ගෙවීම් රු. 18,000 ( චෙක්පත් අංක 00548 ) |
| | 1/12 | භාණ්ඩ විකුණුම් රු. 110,000 |
| | 1/16 | ණයගැති ලැබීම් රු. 60,000 |
| | 1/20 | සේවක වැටුප් ගෙවීම් රු. 40,000 ( චෙක්පත් අංක 00549 ) |
| | 1/23 | සුළු මුදල් ප්‍රතිපූර්ණය කිරීම රු. 27,000 ( චෙක්පත් අංක 00550 ) |
| | 1/24 | ලිපිද්‍රව්‍ය මිලට ගැනීම් රු. 12,000 ( චෙක්පත් අංක 00551 ) |
| | 1/28 | ණයහිමියන්ට ගෙවීම් රු. 72,000 ( චෙක්පත් අංක 00552 ) |

( ඉහත සියළු ගනුදෙනු බැංකු ජංගම ගිණුමේ වාර්තා වී ඇතැයි උපකල්පනය කරන්න )

## සැසඳුම් ප්‍රකාශය

සැසඳීමකින් හදුනාගැනීමට උත්සාහ කරන්නේ කිසියම් වූ විචල්‍යයන් දෙකක් අතර වෙනසට හේතුවයි. ඒ අනුව සැසඳුම් ප්‍රකාශයක් මගින් යම් කිසි විචලයයන් / ශේෂයන් දෙකක් අතර වෙනසට හේතු සොයා බලා ඒවා සන්සන්දනය කර ඉදිරිපත් කිරීමයි.

මේ අනුව ව්‍යාපාරයක් පහත සඳහන් සැසඳුම් ප්‍රකාශයන් පිළියෙල කරයි.

- බැංකු සැසඳුම් ප්‍රකාශය
- ණයගැති සැසඳුම් ප්‍රකාශය
- ණයහිමි සැසඳුම් ප්‍රකාශය
- තොග සැසඳුම් ප්‍රකාශය

## බැංකු සැසඳුම් ප්‍රකාශය

මුදල් පාලන ගිණුමේ කිසියම් දිනකට( මාසය අවසාන දිනට ) ශේෂයත් , එදිනට අදාල මාසික බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂයත් සම නොවූ විටක එම වෙනසට හේතු හදුනාගනිමින් , එම හේතු තහවුරු කර ගැනීම සඳහා සංසන්ධනාත්මකව ඉදිරිපත් කරමින් පාලන උපක්‍රමයක් ලෙස ව්‍යාපාරය පිළියෙල කරනු ලබන ප්‍රකාශය බැංකු සැසඳුම් ප්‍රකාශය ලෙස හඳුන්වයි.

මෙම ප්‍රකාශය තුලින් වෙනසට හේතු වූ කරුණු පිළිබඳ හදුනා ගැනීමේ හැකියාව ඇතිවේ.

JMC Learning "your virtual learning partner"

## බැංකු සැසඳුම් ප්‍රකාශයක් සකස් කිරීම අවශ්‍ය වීමට හේතු

- ශේෂයන් අසමාන වීමට හේතු , පාලන උපක්‍රමයක් ලෙස සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව
- නිකුත්කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් හඳුනා ගැනීමට හැකි වීම.
- තැන්පත්කළ නමුත් බැර නොවූ / නිෂ්කාශනය නොවූ චෙක්පත් හඳුනා ගැනීමට හැකි වීම
- බැංකු ජංගම මඟින් සිදුකළ හැකි වැරදි හා වංචා වලක්වා ගත හැකි වීම
- මුදල් පාලන ගිණුමේ සටහන් නොවූ අයිතම හඳුනා ගැනීමට හැකි වීම
- මුදල් පාලන ගිණුමේ සිදුවූ වැරදි හඳුනා ගැනීමට හැකි වීම
- බැංකු විසින් සිදුකරන ලද වැරදි හර හා බැර කිරීම් හඳුනා ගැනීමට හැකි වීම.

## මුදල් පාලන ගිණුමේ ශේෂයත් , බැංකු විස්තරය අනුව ශේෂයත් එකිනෙක

මුදල් පාලන ගිණුමේ ශේෂයත් බැංකු විස්තරය අන්ව ශේෂයත් සමාන විය යුතු වුවත් ප්‍රායෝගිව පැනනගිනු ලබන ගැටළු සහගත තත්වයන් මත මෙම ශේෂ අසමාන වේ . මේ සඳහා ප්‍රධාන නිර්නායකයන් තුනක් බලපායි.

- ➡ කාල පමාව හේතුවෙන් ශේෂයන් අසමාන වීම
- ➡ වැරදි හේතුවෙන් වන ශේෂ අසමාන වීම
- ➡ මඟහැරීම් මත ශේෂයන් අසමාන වීම

## කාල පමාව හේතුවෙන් ශේෂයන් අසමාන වීම

ඇතැම් ගනුදෙනු වෙනුවෙන් ව්‍යාපාරය විසින් නිකුත් කරන චෙක්පත් මෙන්ම ව්‍යාපාරයට බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන චෙක්පත් ද ඇ බැංකුව අදාල ගනුදෙනු සටහන් කිරීම කිරීම වෙනුවෙන් යම් කාල පමාවක් ගතවේ. එයට හේතුවන්නේ ,

01 . බැංකුවේ තැන්පත් කලත් අදාල චෙක්පත් උපලබ්දි නොවී / නිශ්කාෂණය නොවී ( ගිණුමට බැර නොවී ) පැවතීම.

මුදල් පාලන ගිණුම

බැංකු ප්‍රකාශනය

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| | | | |

02 . නිකුත් කල නමුත් ඉදිරිපත් චෙක්පත් නොවූ චෙක්පත්

( ඇතැම් චෙක්පත් නිකුත් කලද තවම එම චෙක්පත් බැංකුව වෙත ලැබී නොතිබීමයි.මේ නිසා ගිණුමට බැංකු ගිණුම හර වී නොමැත )

මුදල් පාලන ගිණුම

බැංකු ප්‍රකාශනය

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| | | | |

මේ හේතුව නිසා මුදල් පොතේ ශේෂයන් හා බැංකු විස්තරය අනුව ශේෂයන් අතර වෙනස්කම් නිරූපනය කෙරේ.

JMC vLearning "your virtual learning partner"

## වැරදි හේතුවෙන් වන ශේෂ අසමාන වීම

බැංකු ශේෂය හා මුදල් පොතේ ශේෂ අසමාන වීමට වැරදි ආකාර දෙකකට බලපායි.

### 01 . මුදල්පාලන ගිණුමේ සිදුවන වැරදි

මුදල් පාලන ගිණුමේ වැරදි ආකාර කිහිපයකට ඇතිවිය හැක . එනම් මුදල් පාලන ගිණුමේ ගනුදෙනු සටහන් කිරීමේදී හෝ මුදල් පාලන ගිණුම තුලනය කිරීමේදී ඇතිවිය හැකි වැරදි හා ලැබීම් හා ගෙවීම් ජර්නලයේ ගනුදෙනු සටහන් කිරීමේදී හෝ ජර්නලයන්ගේ එකතුව පාලන ගිණුමට ගෙනඒමේදී වැරදි ඇතිවිය හැක.

උදාහරණ :

01. ගනුදෙනුවක් අත්හැරීම

02. ගනුදෙනුවේ අගය වැරදි ලෙස ලකුණු වීම.

03. හර හා බැර පාලන ගිණුමේ නිවරදිව සටහන් නොවීම

04. ලැබීම් හා ගෙවීම් ජර්නලයන් වල එකතුව ලබා ගැනීමේදී වැරදියට එකතු කිරීම්

### 02 . බැංකුව තුල ගනුදෙනු සටහන් කිරීමේදී ඇතිවිය හැකි වැරදි

මෙයින් අදහස් කරන්නේ බැංකුව ගිණුම් හිමියාට අදාල ගනුදෙනු නිවරදිව හඳුනා නොගනීම මත හෝ වෙනත් මානුෂික දෝෂයන් මත වැරදියට සටහන් වීම මත ඇතිවන්නා වූ වැරදින් වේ.

උදාහරණ :

01. අගය වැරදියට ලකුණු වීම

02. වෙනත් ජංගම ගිණුමක පිටපත්වීම

03. පැති මාරු වී සටහන් වීම (ලැබීමක් ගෙවීමක් ලෙස සටහන් වීම)

04. එකතුව (ශේෂය) වැරදි ලෙස හඳුනාගෙන තිබීම

## අත්හැරීම් / මඟහැරීම් මත ශේෂයන් අසමාන වීම

මෙයින් අදහස් කෙරෙන්නේ ඇතැම් ගනුදෙනු එක් පාර්ශවයක් තුල සම්පූර්ණයෙන්ම සටහන් වුවත් අනෙක් පාර්ශවය තුල සටහන් නොවීමයි. මෙම තත්වය මුදල් පොතේ මෙන්ම බැංකු ගිණුම තුලද විය හැකිය. එහෙත් බොහෝවිට දකින්නේ මුදල් පාලන ගිණුම තුල සටහන් නොවන තත්වයකි.

## 01 . චෙක්පත් අගරුවීම මුදල් පාලන ගිණුමේ ලකුණු නොවීම

- තැන්පත් කළ නමුත් අගරු වූ චෙක්පත්

මුදල් පාලන ගිණුම

බැංකු ප්‍රකාශනය

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| | | | |

- නිකුත්කල නමුත් අගරු වූ චෙක්පත්

මුදල් පාලන ගිණුම

බැංකු ප්‍රකාශනය

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| | | | |

JMCLearning
"your virtual learning partner"

## 02. <u>බැංකුව අයකල චෙක්පොත් ගාස්තු මුදල් පාලන ගිණුමේ ඇතුලත් නොවීම</u>

- ❖ මුදල් ගෙවීම් ජර්නලයේ සටහන් නොවීම

මුදල් පාලන ගිණුම

බැංකු ප්‍රකාශනය

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| | | | |

## 03. <u>**බැංකුව අයකල ණය හා අයිරා පොලී මුදල් පාලන ගිණුමේ ඇතුලත් නොවීම**</u>

- ❖ මුදල් ගෙවීම් ජර්නලයේ ඇතුලත් නොවීම

මුදල් පාලන ගිණුම

බැංකු ප්‍රකාශනය

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| | | | |

JMC vLearning
"your virtual learning partner"

## 04. බැංකුව අයකල බැංකු ගාස්තු මුදල් පාලන ගිණුමේ ඇතුලත් නොවීම

- ❖ මුදල් ගෙවීම් ජර්නලයේ ඇතුලත් නොවීම

මුදල් පාලන ගිණුම

බැංකු ප්‍රකාශනය

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| | | | |

## 05. ස්ථාවර නියෝග ගෙවීම් මුදල් පාලන ගිණුමේ ඇතුලත් වී නොතිබීම

මුදල් පාලන ගිණුම

බැංකු ප්‍රකාශනය

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| | | | |

## 06. බැංකුවට ලද සෘජු ප්‍රේෂණ මුදල් පාලන ගිණුමේ ඇතුලත් වී නොතිබීම

JMC vLearning
"your virtual learning partner"

මුදල් පාලන ගිණුම

| | |
|---|---|
| | |

බැංකු ප්‍රකාශනය

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| | | | |

## බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම

මාසික සකස්කරන බැංකු සැසඳුම් ප්‍රකාශයක් සඳහා පහත සඳහන් මූලික පොත්පත් හා ලේකන හා වාර්තා උපයෝගී කරගනී.

01. අදාළ මාසයේ මුදල් පාලන ගිණුම
02. අදාල මාසය වෙනුවෙන් සකස්කරන ලද ලැබීම් හා ගෙවීම් ජර්නලයන්
03. අදාළ මාසයේ බැංකු ප්‍රකාශනය
04. බැංකුවේ මුදල් තැන්පත් කිරීමට අදාල රිසිට්පත්
05. චෙක්පොත් උප පත්‍රිකා ලේකනය
06. චෙක්පත්වල කාලය දීර්ග කිරීම පිළිබඳ ව්‍යාපාරයේ ලේඛන
07. පසුගිය මාසය වෙනුවෙන් සකස්කරන ලද ,
    - ✓ බැංකු සැසඳුම් ප්‍රකාශය
    - ✓ හරනොවූ ගෙවීම් ලේඛනය
    - ✓ බැරනොවූ ලැබීම් ලේකනය
    - ✓ හඳුනා නොගත් ගෙවීම් ලේකන
    - ✓ හඳුනා නොගත් ලැබීම් ලේඛනය

## බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කිරීම අවස්තා දෙකකි

01. මුදල් පාලන ගිණුම සංශෝධනය කරමින් බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කිරීම
02. සියළු තොරතුරු බැංකු සැසඳුම් ප්‍රකාශයට ඇතුලත් කරමින් බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කිරීම.

### මුදල් පාලන ගිණුම සංශෝධනය කරමින් බැංකු සැසඳුම්

පියවර 01.

මුදල් පාලන ගිණුමේ හර තීරුව සමඟ ලැබීම් ජර්නලය සහ බැංකු ප්‍රකාශයේ බැර තීරුව ( තැන්පතු ) සංසන්දනය කිරීම

මෙහිදී පහත සඳහන් අයිතමයන් හඳුනා ගත යුතුය.

- මුදල් පාලන ගිණුමේ හර තීරුවේ පමණක් සටහන්ව ඇති අයිතමයන්
  - තැන්පත්කල නමුත් නිෂ්කාර්ෂණය නොවූ චෙක්පත්
  - මුදල් පොතේ වැරදි
- බැංකු ප්‍රකාශයේ බැර තීරුවේ පමණක් සටහන්ව ඇති අයිතමයන්
  - ව්‍යාපරය වෙනුවෙන් බැංකුවට සෘජුවම ලැබුන මුදල් ( සෘජු ප්‍රේෂණ )

    උදාහරණ : බැංකුවට ලැබෙන ලාභාංශ , පොලී , ණයගැති ප්‍රේෂණ

පියවර 02.

මුදල් පාලන ගිණුමේ බැර තීරුව සමඟ මුදල් ගෙවීම් ජර්නලය සහ බැංකු ප්‍රකාශයේ හර ( ගෙවීම් ) තීරුව සංසන්දනය කිරීම

මෙහිදී පහත සඳහන් අයිතමයන් හඳුනාගත යුතුය

- මුදල් පාලන ගිණුමේ බැර තීරුවේ සමණක් සටහන්ව ඇති අයිතමයන්
  - නිකුත්කල නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්
  - මුදල් පොතේ වැරදි
- බැංකු ප්‍රකාශයේ හර තීරුවේ පමණක් සටහන්ව ඇති අයිතමයන්
  - බැංකු ගාස්තු , චෙක්පොත් ගාස්තු
  - ස්ථාවර නියෝග මත බැංකුව කරන ගෙවීම්

පියවර 03.

සංශෝධිත මුදල් පාලන ගිණුම පිළියෙල කිරීම

- ඉහත පියවර 1 හා පියවර 2 හිදී හඳුනා ගන්නා ලද අයිතමයන් අතුරෙන් මුදල් පාලන ගිණුමේ ඇතුලත් විය යුතු එහෙත් මුදල් පාලන ගිණුමේ ඇතුලත් වී නැති ගනුදෙනු හඳුනා ගනිමින් මුදල් පාලන ගිණුමේ ගලපා මුදල් පාලන ගිණුමේ සංශෝධිත ශේෂය ලබා ගැනීම සිදු කල යුතුය .

පියවර 04.

බැංකු සැසඳුම්ප්‍රකාශය පිළියෙල කිරීම

බැංකු ප්‍රකාශයේ ශේෂයත් , මුදල් පාලන ගිණුමේ ශේෂයත් අතර වෙනස සඳහා බලපානු ලැබූ හේතූන් අතුරින් මුදල් පාලන ගිණුම සංශෝනය කිරීමට අදාල හේතූන් ගැලපූ පසු තවදුරටත් ඉතිරිවන හේතූන් පදනම් කරගනිමින් බැංකු සැසැඳුම් ප්‍රකාශය පිළියෙල කල යුතුය.

මෙහිදී බොහෝවිට ගැලපීමට සිදුවන්නේ පහත සඳහනා අයිතමයන්වේ.

- තැන්පත් කල නමුත් නිෂ්කාෂණය නොවූ චෙක්පත්
- නිකුත්කල නමුත් බැංකුවට ඉදිරිපත් නොකල චෙක්පත්
- බැංකුවේ සිදුවී ඇති වෙනත් හඳුනාගත් දෝශයන් වේ.

මේ පියවරයන් යටතේ පිළියෙල කරනු ලබන බැංකු සැසඳුම් ප්‍රකාශයට කිසිදු විටක මුදල් පාලන ගිණුමේ සිදුවී ඇති දෝෂයන් / වැරදි නොගැලපිය යුතු අතර ඒවා ගැලපිය යුතු වන්නේ මුදල් පාලන ගිණුමේය.

එමෙන්ම බැංකුව විසින් සිදුකරන ලද වැරදි හඳුනාගත් විට ඒවා ගැලපිය යුතු වන්නේ බැංකු සැසඳුම් ප්‍රකාශයේ පමණි. කිසිදු විටක මුදල් පාලන ගිණුමට නොගැලපිය යුතුය.

<u>පෙර මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය සැලකිල්ලට ගැනීම</u>

JMCVLearning "your virtual learning partner"

### සංශෝධිත මුදල් පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ඉ / ගෙ / ශේෂය | XXXXX | අගරු චෙක්පත් | XX |
| | | බැංකු ගාස්තු | XX |
| සෘජු ප්‍රේෂණ - ණයගැති | XXX | රක්ෂණ වාරික ( වැනි වියදම්) | XX |
| ලද ලාභාංශ | XXX | මුදල් පාලන ගිණුමේ වැරදි නිවරදි කිරීම | XX |
| | | ප / ගෙ /ශේෂය | XXX |
| | XXXX | | XXXXX |
| ඉ / ගෙ / ශේෂය | XXX | | |

## <u>බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමට යෝජිත අකෘතීන්</u>

**මුදල් පාලන ගිණුමේ සංශෝධිත ශේෂයෙන් ආරම්භ කරමින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම**

### <u>යෝජිත ආකෘති</u>

...............................ව්‍යාපාරය...............................මාසයට , බැංකු සැසඳුම් ප්‍රකාශයය

| විස්තරය | රු. | රු. |
|---|---|---|
| සංශෝධිත මුදල් පාලන ගිණුම අනුව ශේෂය | | XXXX |
| එකතුකලා : | | |
| ........................................................................................ | | |
| ........................................................................................ | | |
| ........................................................................................ | | |
| අඩුකලා : | | |
| ........................................................................................ | | |
| ........................................................................................ | | |
| ........................................................................................ | | |
| ........................................................................................ | | |
| බැංකු ප්‍රකාශයට අනුව ශේෂය | | XXXXX |

JMC Learning "your virtual learning partner"

## බැංකු ප්‍රකාශයටය අනුව ශේෂයෙන් ආරම්භ කරමින් බැංකු සැසදුම්

<u>යෝජිත ආකෘතිය</u>

...............................ව්‍යාපාරය...............................මාසයට , බැංකු සැසඳුම් ප්‍රකාශය

| විස්තරය | රු | රු |
|---|---|---|
| බැංකු ප්‍රකාශයට අනුව ශේෂය | | XXXXX |
| එකතුකලා : | | |
| ........................................................................................ | | |
| ........................................................................................ | | |
| ........................................................................................ | | |
| ........................................................................................ | | |
| අඩුකලා : | | |
| ........................................................................................ | | |
| ........................................................................................ | | |
| ........................................................................................ | | |
| සංශෝධිත මුදල් පාලන ගිණුම අනුව ශේෂය | | XXXXX |

## බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කිරීමේ අරමුණු :

**බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ මුදල් පාලන ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ දැක්වෙන ශේෂය අතර කිසියම් අසමානතාවයක් පෙන්නුම් කරන්නේ නම් ඊට බලපා තිබෙන හේතු හඳුනා ගැනීමයි.**

මෙම අරමුන ප්‍රධාන අරමුණ වන අතර මෙම අරමුණට අමතරව පහත සඳහන් අරමුණු ද බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිලියෙල කිරීම තුලින් ඉටුකර ගත හැකිය .

01. බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම හා ඒවායේ කාල ප්‍රමාදයන් දැන ගැනීමට හැකිය.
02. කල් ඉකුත් වී ඇති චෙක්පත් අවලංගු කර අකර්මන්‍යව පවතින මුදල් යලි භාවිතයට ගැනීමට හැකි වීම

JMC vLearning your virtual learning partner

03. කාරක ප්‍රාග්ධන අවශ්‍යතා කල්තියා හඳුනා ගනිමින් අයිරා පහසුකම් වල අවශ්‍යතාවය පිළිබඳ නිගමන වලට ඒමේ හැකියාව
04. වංචා වලක්වා ගැනීම තුලින් අභ්‍යන්තර මූල්‍ය පාලනය ශක්තිමත් කර ගැනීම
05. ව්‍යාපාරයේ ගිණුම්වල පවතින වැරදි හා මඟහැරීම් හඳුනා ගනිමින් නිවරදි කර ගැනීමට හැකියාව ඇතිවේ.
06. වෙනත් ආයතනයක් පවත්වා ගන්නා පොත්වල නිවරදි තාවය සහතික කර ගැනීමට හැකිවේ.
07. විගණනය සඳහා පහසුවක් වීම හා විවිධ නීතිමය අවශ්‍යතා වෙනුවෙන් බැංකු සැසඳුම් ඉදිරිපත් කිරීමේ හැකියාව

උදාහරණ 02 :

2018 ජබවාරි 31 දිනට කමල්සිරි ව්‍යාපාරයේ මුදල්පොත අනුව රු. 48,500 ක වාසිදායක ශේෂයක් පෙන්නුම් කළේය. බැංකු ප්‍රකාශනය අනුව ශේෂය මුදල් පාලන ගිණුමේ ශේෂයට වෙනස් විය . මුදල් පාලන ගිණුමේ සටහන් බැංකු ප්‍රකාශනයේ සටහන් සමඟ සැසඳීමේදී පහත සඳහන් දෑ අනාවරණය විය.

01. ව්‍යාපාරයේ ස්ථාවර තැන්පත් සඳහා වූ කාර්තුමය පොළිය වූ රු. 25,750 ක් අදාල බැංකුව විසින් ව්‍යාපාරයේ බැංකු ගිණුමට කෙළින්ම බැර කර ඇත.
02. තැන්පත් කරන ලද රු. 20,200 ක චෙක්පත 2018 ජනවාරි මස අවසන් වනතුරුත් උපලබ්ධි වී නොතිබුණි.
03. ගෙවීම සඳහා 2018 ජනවාරි මාසයේ දී නිකුත් කරන ලද රු. 10,500 ක් සඳහා වූ චෙක්පතක් වැරදීමකින් මුදල් ගෙවීම් ජර්නලයේ සටහන් වී නොතිබුණි.
04. 2018 ජනවාරි මස වෙනුවෙන් ස්ථාවර නියෝග යටතේ ගෙවන ලද රක්ෂණ වාරිකය වන රු. 5,500 ක් මුදල් පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.
05. 2018 ජනවාරි වෙනුවෙන් අයකල බැංකු ගාස්තු මුදල් පාලන ගිණුමේ සටහන් වී නොතිබුණි.
06. 2018 ජනවාරි මස නිකුත්කරන ලද රු. 38,000 ක චෙක්පත් බැංකුවට ගෙවීමට ඉදිරිපත් කර තිබුනේ පෙබරවාරි මස 05 දිනය.

ඔබ විසින් ,

01. මුදල් පාලන ගිණුමට අවශ්‍ය ගැලපීම් දක්වමින් සංශෝධිත මුදල් පාලන ගිණුම

02. 2018 ජනවාරි මස 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂය දක්වන්න

උදාහරණ 03:

සිසිර ව්‍යාපාරයේ 2018 මාර්තු 31 දිනට මුදල් පාලන ගිණුමේ රු. 130,700 ක අයිරාවක් පෙන්වන ශේෂයන් දක්නට ලැබුනද එදිනට බැංකු ප්‍රකාශයේ දක්නට ලැබුනේ රු. 91,100 ක් වූ අයිරා ශේෂයකි.

මුදල් පාලන ගිණුම හා බැංකු වාර්තාවේ සටහන් සමඟ සැසඳීමේදී පහත දෑ හෙළිදරව් විය.

01. රු. 350 ක් වූ බැංකු ගාස්තු මුදල් පාලන ගිණුමේ සටහන් වී නොතිබුණි.
02. මාර්තු මස තැන්පත් කල නමුත් උපලබ්දි නොවූ චෙක්පත් වල වටිනාකම රු. 132,100 කි.
03. මාසය තුල රු. 4,271 ක ගෙවීමක් මුදල් පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.
04. ස්තාවර නියෝග යටතේ කරන ලද රු. 37,500 ක රක්ෂණ වාරික මුදල් පාලන ගිණුමේ සටහන් කර නොතිබුණි.
05. මාර්තු මාසයේ නිකුත්කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම රු. 132,142 කි.
06. ගනුදෙනු කරුවකු විසින් කෙලින්ම බැංකුවේ තැන්පත්කල රු. 85,950 ක මුදලක් මුදල් පාලන ගිණුමේ දටහන් කර නොමැත.

ඔබ විසින් ,

01. මුදල් පාලන ගිණුමට අවශ්‍ය ගැලපීම් දක්වමින් සංශෝධිත මුදල් පාලන ගිණුම
02. 2018 මාර්තු මස 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කර බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂය දක්වන්න

## සියළු තොරතුරු බැංකු සැසඳුම්_ප්‍රකාශයට ඇතුලත් කරමින් බැංකු සැසඳුම්

මෙම ක්‍රමයේ දී සංශෝධිත මුදල් පාලන ගිණුමක් පිළියෙල නොකරන අතර සියළු ගැලපීම් බැංකු සැසඳුම් ප්‍රකාශය තුලින්ම සිදුකරයි.

ඒ අනුව පෙර පරිදිම මුදල් පාලන ගිණුම හා බැංකු විස්තරය සංසන්දනය කරමින්

- ✓ මුදල් පාලන ගිණුමේ ඇතුලත් කල යුතු එහෙත් මුදල් පාලන ගිණුමේ ඇතුලත් නොවූ තොරතුරු මෙන්ම මුදල් පාලන ගිණුමේ සිදුවී ඇති වැරදි යන සියළුම ගැලපීම් බැංකු සැසඳුම් ප්‍රකාශයට ඇතුලත් කරයි.

- ✓ බැංකුව වෙත නිකුත්කල නමුත් ඉදිරිපත් නොවූ හා තැන්පත්කල නමුත් උපලබ්දි නොවූ මෙන්ම බැංකුවේ වැරදි ද නිවරදි කිරීම වෙනුවෙන් පෙර පරිදිම බැංකු සැසඳුම් ප්‍රකාශයට ඇතුලත් කරයිමෙම ආකාරයට සකස් කරනු ලබන බැංකු සැසඳුම් ප්‍රකාශයක ආකෘතියක් පහත පරිදි ඉදිරිපත් කල හැක



## 01.<u>මුදල් පාලන ගිණුමේ ශේෂයෙන් ආරම්භ කරමින්</u>

...............................ව්‍යාපාරය

...............................මාසයට , බැංකු සැසඳුම් ප්‍රකාශය

| | | |
|---|---|---|
| මුදල් පාලන ගිණුමේ ශේෂය | | XXXXX |
| + එකතුකලා : නිකුත්කල නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් | XXX | |
| ස්ථාවර නියෝග මත රැස් කිරීම් | XXX | |
| සෘජු ප්‍රේෂණ | XXX | |
| නිකුත්කල එහෙත් අඟරු චෙක්පත් | XXX | |
| ව්‍යාපාරය තම ගිණුම අඩුවෙන් හර කිරීම් | XXX | |
| බැංකුව වැරදියට බැර කිරීම් | XXX | XXXX |
| | | XXXXXX |
| අඩුකලා : තැන්පත්කල නමුත් උපලබ්ධි නොවූ චෙක් | XXX | |
| ස්ථාවර නියෝග මත ගෙවීම් | XXX | |
| තැන්පත්කල එහෙත් අඟරුචෙක්පත් | XXX | |
| බැංකු ගාස්තු | XXXX | |
| මුදල් ගිණුමේ වැඩියෙන් එකතු කිරීම් | XXXX | |

JMC vLearning
"your virtual learning partner"

| | | |
|---|---|---|
| බැංකුව වැරදියට හර කිරීම් | XXXX | ( XXXX ) |
| බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | XXXX |

02. බැංකු ප්‍රකාශය අනුව ශේෂයෙන් ආරම්භ කරමින්

...............................ව්‍යාපාරය

...............................මාසයට , බැංකු සැසඳුම් ප්‍රකාශය

| | | |
|---|---|---|
| බැංකු ප්‍රකාශය අනුව ශේෂය<br>එකතුකලා : ...............................................................<br>...........................................................................<br>.........................................................................<br>...........................................................................<br>...........................................................................<br>...........................................................................<br>.......................................................................<br><br>අඩුකලා : ..................................................................<br>............................................................................<br>............................................................................<br>............................................................................<br>............................................................................<br>............................................................................<br>................................................................................<br>මුදල් පාලන ගිණුම අනුව ශේෂය | | XXXX<br><br><br><br><br><br><br><br><br><br><br><br><br><br>XXXX |

JMC vLearning "your virtual learning partner"

උදාහරණ 04 :

2018 ජනවාරි මාසය සඳහා නිහාල්ගේ ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුමේ ශේෂය එම මාසයට ලද බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂය සමඟ සමාන නොවීය. ජනවාර් 31 දිනට මුදල් පාලන ගිණුම අනුව ශේෂය රු. 129,000 කි. බැංකු ප්‍රකාශය අනුව ශේෂය රු. 60,000 ක් බව නිරීක්ෂණය විය . පසුව පහත සඳහන් කරුණු හෙළිදරව් කර ගන්නා ලදී.

01. ණයගැති සෘජු ප්‍රේෂණ වී රු. 18,000 ක් මුදල් පාලන ගිණුමේ සටහන්ව නැත
02. ණයගැතියකුගෙන් ලැබී බැංකුවේ තැන්පත් කරන ලද රු. 20,000 ක චෙක්පත් අඟරු වීම මුදල් පාලන ගිණුමේ සටහන් කර නැත.
03. ජනවාරි මාසයේ පහත සඳහන් චෙක්පත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් පත් කර නොතිබුණි

    චෙක් අංක 0012565 - රු. 30,000

    චෙක් අංක 0012566 - රු. 24,000

04. බැංකුව අයකල බැංකු ගාස්තු රු. 3,000කි. තවද ව්‍යාපාරය වෙනුවෙන් ගෙවන ලද රක්ෂණ වාරික රු. 28,000 ක්ද මුදල් පාලන ගිණුමේ සටහන්ව නැත.
05. පහත සඳහන් චෙක්පත් තැන්පත් කරන ලද නමුත් උපලබ්ධි වී නොතිබුණි.

    චෙක් අංක 0014512 - රු. 74,000

    චෙක් අංක 0015514 - රු. 3,000
06. ව්‍යාපාරය වෙනුවෙන් බැංකුවට ලද ලාභාංශ රු. 12,000 කි. මුදල් පාලන ගිණුමේ සටහන්ව නැත
07. මුදල් පාලන ගිණුමේ හර පැත්ත රු. 9,000 ක් වැඩිපුර එකත් කර දක්වා තිබුණි.
08. බැංකුවට ඉදිරිපත් වී ඇති 00012542 චෙක්පත වෙනුවෙන් රු. 16,000 ගෙවා තිබුණි. නමුත් මෙය ව්‍යාපාරයට අදාල චෙක්පතක් නොවීය.

ඉහත තොරතුරු ඇසුරින් බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කරන්න.

## බැංකු අයිරාව

ව්‍යාපාරය සහ වාණිජ බැංකුව අතර ඇතිකර ගන්නා වූ එකඟතාවය අනුව ව්‍යාපාරයේ ජංගම ගිණුමේ පවතින මුදල් / තැන්පතු ප්‍රමාණය ඉක්මවා චෙක්පත් නිකුත් කිරීමට ව්‍යාපාරයට බැංකුව ලබාදී ඇති පහසුකම බැංකු අයිරා පහසුකමයි. මෙය ව්‍යාපාරිකයා

බැංකුවෙන් ලබා ගන්නා කෙටිකාලීන ණයකි. මේ සදහා පොලියක් ව්‍යාපාරිකයා ගෙවිය යුතු අතර එය අයිරා පොලී ලෙස හදුන්වයි. බැංකු අයිරා පහසුකම ව්‍යාපාරයකට බැංකුව විසින් සපයනු ලබන්නේ බැංකුව සමඟ ව්‍යාපාරික සම්බන්ධතාවය තව දුරටත් තහවුරු කර ගැනිම සඳහා වේ.

## චෙක්පත් අඟරු වීම

ව්‍යාපාරය වෙත ලැබී බැංකුවේ තැන්පත් කල චෙක්පතකට මුදල් ගෙවීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ ව්‍යාපාරය ගෙවීමක් වෙනුවෙන් නිකුත් කල චෙක්පතක් වෙනුවෙන් මුදල් ගෙවීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කිරීම චෙක්පත් අඟරු වීම ලෙස හදන්වයි. චෙක්පතට මුදල් ගෙවීම බැංකුව  ප්‍රතික්ෂේප කල විට ඒ පිළිබඳව බැංකුව නිවේදනයකින් දැනුම් දේ.

චෙක්පත් අගරු කිරීම ,

- ✓ අණකරුගේ ගිණුමේ මුදල් නොමැති වීම
- ✓ නිසි පරිදි අයිරා පහසුකම් නොලැබීම
- ✓ චෙක්පත් විධිමත් ලෙස පිළියෙල කර නොතිබීම
- ✓ අණකරුගේ ආදර්ශ අත්සන චෙක්පතේ සඳහන් අත්සන සමඟ නොගැලපීම
- ✓ අකුරෙන් සහ ඉලක්කමෙන් දක්වා ඇති වටිනාකම් වල නොසැසඳීම
- ✓ චෙක්පත වෙනස් කිරීම අණකරු විසින් සහතික කර නොතිබීම

# චෙක්පත් අඟරු කිරීම ගිණුම්ගත කිරීම

චෙක්පත අඟරු වීම වෙනුවෙන් ව්‍යාපාරය සිය ලෙජරයේ සටහන් කිරීමේදී  අදාල චෙක්පත ව්‍යාපාරය විසින් නිකුත් කල චෙක්පතක්ද නැතහොත් ව්‍යාපාරයට ලැබී බැංකුවේ තැන්පත් කල චෙක්පතක්ද යන්න මුලින්ම සලකා බැලිය යුතුය.

- ❖ ව්‍යාපාරය විසින් නිකුත් කල චෙක්පතක් අඟරු වීම
- ❖ ව්‍යාපාරය වෙත ලද බැංකුවේ තැන්පත් කල චෙක්පතක් අඟරු වීම.

01. ව්‍යාපාරය විසින් නිකුත් කල චෙක්පතක් අගරු වීම ගිණුම්ගත කිරීම .

මුදල් පාලන ගිණුම හර

අගරු චෙක්පත් ගිණුම බැර

( ව්‍යාපාරය නිකුත් කල චෙක්පත අගරු වීම සටහන් කිරීම )

අගරු චෙකපත් ගිණුම හර

මුදල් පාලන ගිණුම බැර

( අගරු චෙක්පත වෙනුවෙන් නව චෙක්පතක් ණයහිමියා වෙත නිකුත් කිරීම )

02. ව්‍යාපාරය වෙත ලද බැංකුවේ තැන්පත් කල චෙක්පතක් අගරු වීම.

අගරු චෙක්පත් ගිණුම හර

මුදල් පාලන ගිණුම බැර

(ව්‍යාපාරය වෙත අගරු චෙක්පත් ලැබීම සටහන් කිරීම )

මුදල් පාලන හර

අගරු චෙක්පත් ගිණුම බැර

(අගරු කරන ලද චෙක්පත වෙනුවෙන් නව චෙක්පතක් ලැබීම සටහන් කිරීම )

අගරු චෙක්පත වෙනුවෙන් අදාල ණයගැතියාට දැනුම් දුන් පසු නව චෙක්පතක් වෙනුවට ව්‍යාපාරය වෙත මුදල් ගෙවීමක් සිදු කරයි නම් .

මුදල් පාලන ගිණුම හර

අගරු චෙක්පත් ගිණුම බැර

( අගරු චෙක්පත වෙනුවෙන් ලද මුදල් සටහන් කිරීම )

03. අගරුචෙක්පත ව්‍යාපාරය විසින් ණයගැතියා වෙත ආපසු හරවා යැවීම සිදු කරයි නම් ,

ණයගැතියා ගිණුම හර

අගරු චෙක්පත් ගිණුම බැර

( අගරු චෙක්පත ණයගැතියා වෙත යැවීම සටහන් කිරීම )

04. ණයගැතියාගෙන් මුදල් නොලැබීම සිදුවන බව කළමනාකරණය තීරණය කරයි නම් ,

බොල්ණය ගිණුම හර

JMC vLearning your virtual learning partner

ණයගැතියා ගිණුම                    බැර

(බොල්ණය ලෙස කපා හැරීම සටහන් කිරීම )

# අභ්‍යාස

**Question**

නයනගේ ව්‍යාපාරයේ 2018 ජනවාරි මාසයේ බැංකුව සමඟ කළ ගනුදෙනු වාර්තා කිරීමෙන් පසු මුදල් පාලන ගිණුම පහත පරිදි විය.

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 1/1 | ඉ/ගෙ/ශේෂය | 50,000 | 1/2 | වරිපනම් 120500 | 5,000 |
| 1/3 | මුදල් | 20,000 | 1/5 | රණසිංහ 120501 | 10,000 |
| 1/6 | මානෙල් 442450 | 12,000 | 1/10 | නයෝමි 120502 | 20,000 |
| 1/14 | පියල් 729451 | 8,000 | 1/15 | කුලී 120503 | 10,000 |
| 1/20 | විකුණුම් 885512 | 15,000 | 1/20 | විදුලිය 120504 | 8,000 |
| 1/27 | මුදල් | 10,000 | 1/25 | සිල්වා 120505 | 10,000 |
| 1/30 | පෙරේරා 512151 | 8,000 | 1/29 | නලින් 120506 | 15,000 |
| | | | | ප/ගෙ/ශේෂය | 45,000 |
| | | 123,000 | | | 123,000 |
| | ඉ/ගෙ/ශේෂය | 45,000 | | | |

JMC vLearning
"your virtual learning partner"

නයනගේ ව්‍යාපාරයේ 2017 ජනවාරි මාසයේ බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර රු. | බැර රු. | ශේෂය රු. |
|---|---|---|---|---|
| 1/1 | ඉ/ගෙ/ශේෂය | | | 50,000 |
| 1/2 | ගෙවීම් 120500 | 5,000 | | 45,000 |
| 1/4 | මුදල් තැන්පතු | | 20,000 | 65,000 |
| 1/10 | තැන්පතු 442450 | | 12,000 | 77,000 |
| 1/10 | ගෙවීම් 120502 | 20,000 | | 57,000 |
| 1/16 | ගෙවීම් 120503 | 10,000 | | 47,000 |
| 1/27 | ගෙවීම් 120505 | 10,000 | | 37,000 |
| 1/27 | මුදල් තැන්පතු | | 10,000 | 47,000 |
| 1/30 | බැංකු ගාස්තු | 2,000 | | 45,000 |
| 1/30 | ස්ථාවර නියෝග( රක්ෂණ ගාස්තු ) | 10,000 | | 35,000 |
| 1/30 | චෙක් තැන්පතු 132400 | | 5,000 | 40,000 |
| 1/30 | චෙක්පොත් ගාස්තු | 1,000 | | 39,000 |

ඔබ විසින් ,

a) නයනගේ ව්‍යාපාරයේ බැංකු ගිණුම සහ බැංකු ප්‍රකාශනය සංසන්දනය කර බැංකු ගිණුමේ ශේෂය රු. 45,000 සහ බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 39,000 අතර වෙනසට බලපාන ලද හේතු වර්ග කර නම් කරන්න.

b) 2018 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙල කරන්න.

**Question**

කුසුම්සිරිගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි 31 දිනට බැංකු ගිණුමේ හර ශේෂය රු. 3,000 කි. එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය රු.( 2,000 ) ක් වූ අතර වෙනසට හේතු බැංකු ගිණුම සහ බැංකු ප්‍රකාශනය සංසන්දනය කිරීමෙන් සොයා ගන්නා ලදී.

I. බැංකුවේ තැන්පත් කරන ලද රු. 5,000 ක චෙක්පතක් අගරු වී අගරු නිවේදනය ලැබී තිබේ. එම අගරු වීම මුදල් පාලන ගිණුමේ සටහන් කර නොමැත.

II. ස්ථාවර නියෝග මත බැංකුව විසින් රු. 10,000 ක කුලී ගෙවා ඇති අතර රු. 15,000 ක ලාභාංශ ගිණුමට එකතු කරගෙන ( බැර ) තිබුණි.

III. මුදල් පාලන ගිණුම තුලනය කිරීමේදී බැර පැත්ත රු. 1,000 ක් වැඩියෙන් එකතු කර තිබුණි.

IV. බැංකුව අයකරගෙන තිබූ බැංකු ගාස්තු රු. 1,000 ක් බැංකු ප්‍රකාශනයේ සඳහන් වී තිබුණි.

JMC vLearning "your virtual learning partner"

V. නිකුත්කරන ලද රු.1,000 චෙක්පත බැංකුවට ඉදිරිපත් වී නොතිබුණි.

VI. සිල්වා / ණයගැතියා රු. 12,000 ක් සෘජුවම බැංකුවේ තැන්පත් කර ඇති අතර ව්‍යාපාරයේ පොත් වල සටහන් වී නොමැත.

VII. බැංකුවේ තැන්පත් කල නමුත් බැංකුව විසින් බැර නොකල ( උපලබ්දි නොවූ ) චෙක්පත් වල වටිනාකම රු. 18,000 ක් විය.

ඔබ විසින් ,

a) කුසුම්සිරිගේ ව්‍යාපාරයේ සංශෝධිත මුදල් පාලන ගිණුම,
b) 2020 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න.

## Question

අරලිය සමාගම 2020 මාර්තු 31 දිනට බැංකු විසින් එවන ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 5,000 ක බැර ශේෂයක් ( වාසි දායක ) ලෙස සඳහන් කර තිබුණි. එදිනට ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුමේ ශේෂය එම ශේෂයට වෙනස් විය . සංසන්ධනය කිරීමේදී පහත තොරතුරු අනාවරණය විය.

I. බැංකුව විසින් අඟරු කරන ලද ( කමල් ගෙන් ලද ) රු. 8,000 ක චෙක්පත මුදල් පාලන ගිණුමේ සටහන් නොවීය.

II. බැංකු ප්‍රකාශනයේ පමණක් පහත සඳහන් ගනුදෙනු ඇතුලත් විය.
බැංකු ගාස්තු රු. 1,500 යි.
ස්ථාවර ගාස්තු මත ගෙවන ලද කුලී රු. 8,000
නිමල් / ණයගැතියා සෘජුවම බැංකුවේ තැන්පත් කල වටිනාකම රු. 4,000

III. සැපයුම් කරුවකුට නිකුත් කරන ලද රු. 20,000 ක චෙක්පත බැංකුවට ඉදිරිපත් වී නැත.

IV. රු.28,000 ක් වටිනා බැංකුවේ තැන්පත් කල චෙක්පත මාර්තු 31 වන විටත් උපලබ්දී වී නැත.

අවශ්‍ය වන්නේ ,

a) 2020 මාර්තු මාසය සඳහා සංශෝධිත මුදල් පාලන ගිණුම
b) 2020 මාර්තු මාසය සඳහා බැංකු සැසදුම් ප්‍රකාශය
c) චෙක්පත් අඟරු වීමට අදාල ජර්නල් සටහන්

JMC vLearning "your virtual learning partner"

**Question**

පහත සඳහන් බැංකු සැසඳුම් විස්තරය සිලලර වෙළඳ ආයතනයක් වූ අමිල ස්ටෝර්ස් සඳහා 2020 ජනවාරි 31 දිනට අවසන් මාසය වෙනුවෙන් පිළියෙල කරන ලදී .

| | | |
|---|---|---|
| බැංකු ගිණුම් විස්තරය අනුව ශේෂය ( වාසි සහගත ) | | 72,900 |
| එකතු කලා ( + ) | | |
| තැන්පත් කරන ලද නමුත් බැංකුව විසින් අඟරු කරන ලද ගනුදෙනු කරුවන්ගේ චෙක්පත් | 2,100 | |
| චමිල ස්ටෝර්ස් විසින් නිකුත් කරන ලද චෙක්පත් අමිල ස්ටෝර්ස් ගිණුමට බැර කිරීම | 375 | |
| බැංකුව විසින් මෙතෙක් බැර නොකල තැන්පතු | 3,275 | |
| මුදල් පොතේ සටහන් නොවූ බැංකුව අයකල කොමිස් | 50 | 5,800 |
| අඩුකලා ( - ) | | |
| ගෙවීම සඳහා බදිරිපත් නොකල චෙක්පත් | 2,350 | |
| මුදල්පොතේ ඇතුලත් නොකල උකස් ණය වශයෙන් ලැබුන මුදල | 25,000 | |
| රු.1650/- ක් බන්වොයිසියක් වෙනුවෙන් නිකුත් කල චෙක්පත බැංකුව විසින් රු. 1,000/- වශයෙන් ඇතුලත් කර තිබීම | 650 | ( 28,000 ) |
| | | 50,700 |

ඔබ විසින් ,

01. අදාල ගැලපීම් පෙන්වන ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුම
02. 2020 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය ( 1985 )

JMC vLearning "your virtual learning partner"

Question

සී/ස සිංහ සමාගමේ 2020 මාර්තු 31 දිනෙන් අවසන් මාසය සඳහා මුදල් පොතේ සාරාංශය පහත දැක්වේ.

මුදල් පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ආරම්භක ශේෂය | 8,050 | ගෙවීම් | 1,462,030 |
| ලැබීම් | 1,457,200 | අවසාන ශේෂය | 3,220 |
| | 1,465,250 | | 1,465,250 |

මුදල් ලැබීම් හා ගෙවීම් ජර්නල් පරීක්ෂා කිරීමෙන් පසු පහත දැක්වෙන වැරදි සහ වෙනස් කම් හඳුනා ගනු ලැබීය.

I. බැංකු විස්තරයේ දැක්වෙන බැංකු ගාස්තු රු. 134/- ක් මුදල් පාලන ගිණුමේ ඇතුලත් කර නැත.

II. නිකුත් කරන ලද රු.230/- ක චෙක්පතක් ලැබීම් ලෙස මුදල් ලැබීම් ජර්නලය තුල සටහන් කර ඇත.

III. රු. 1,506/- ක් සඳහා නිකුත් කරන ලද චෙක්පතක් රු. 1,605/- ක් ලෙසට මුදල් ගෙවීම් ජර්නලය තුල සටහන් කර ඇත.

IV. ගනුදෙනු කරුවකු විසින් බැංකුවට කරන ලද රු. 3,500/- සෘජු ප්‍රේෂණ මුදල් පාලන ගිණුමේ සටහන් කර නැත

V. තැනපත් කරන ලද රු. 1,850/- ක චෙක්පතක් බැංකුව විසින් අණකරු විමසනු යන්න සඳහන් කරමින් ආපසු එවා ඇත. නමුත් මෙ ආපසු එවීම පිළිබඳ සටහන් මුදල් පාලන ගිණුමේ ඇතුලත් කර නොමැත.

VI. සැපයුම් කරුවන් වෙත නිකුත් කරන ලද රු. 6,300/- ක චෙක්පතක් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් වී නොමැති අතර තැන්පත් කරන ලද රු. 4,800 ක චෙක්පතක් බැංකුව මෙතෙක් බැර කර නොමැත.

VII. වෙනත් ගිණුම් හිමියකුට අදාල රු. 780/- ක තැන්පතුවක් බැංකුව විසින් වැරදීමකින් සමාගමේ බැංකු ගිණුමට බැරකර ඇත.

VIII. ස්ථාවර නියෝග මත බැංකුව විසින් කරනු ලැබූ පහත දැක්වෙන ගනුදෙනු මුදල් පාලන ගිණුමේ ඇතුලත් කර නැත.

- ✓ රු. 150,000/- ක ණය මුදලක් සඳහා රු. 9,000/- ක පොලී ගෙවීම
- ✓ යන්ත්‍රාගාර සඳහා මසකට රු. 1,200/- බැගින් මාස 6ක් සඳහා කල්බදු ගෙවීම

- ✓ වෙළඳ ආයෝජනයන් මත ලාභාංශ ලෙස රු. 2,500/- ක් ලැබීම.

මුදල් ලැබීම් ජර්නලයේ එකතුව රු. 1501 කින් අඩුවෙන් එකතු කර ඇත.

ඔබ විසින් ,

01. අදාල ගැලපීම් පෙන්වන ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුම

02. 2020 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය ( 1995 )

## Question

පහත දැක්වෙන තොරතුරු සී/ස කල්‍යාණි සමාගමට අදාල වේ.

2020 ජනවාරි මස බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 3/1 | ශේෂය | | | 15,000 |
| 3/2 | චෙක්පත් | | 8,000 | 23,000 |
| 3/3 | මුදල් | | 20,000 | 43,000 |
| 3/18 | චෙක් - 532451 | 6,000 | | |
| | චෙක් - 532456 | 19,000 | | 18,000 |
| 3/24 | ලාභාංශ | | 2,000 | 20,000 |
| 3/25 | චෙක්පත් | | 4,000 | 24,000 |
| 3/26 | ස්ථාවර නියෝග | 4,000 | | 20,000 |
| 3/27 | චෙක්පත් | | 3,000 | 23,000 |
| 3/31 | චෙක් අගරු | 3,000 | | 20,000 |

A. 2020 පෙබරවාරි මස නිකුත් කල චෙක්පත් වලින් රු. 6,000 ( අංක 532451 ) සහ රු. 8,000 ( අංක 532455 ) වූ චෙක්පත් 2020 මාර්තු 01 දින වන විටත් ගෙවීම සඳහා ඉදිරිපත් වී නොතිබුණි.

B. ලාභාංශ , ස්ථාවර නියෝග හා අගරු චෙක්පත් වාර්තා කිරීමට පෙර 2020 මාර්තු 31 දිනට මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 1,200/- ක් විය .

C. මාර්තු මස නිකුත් කරන ලද චෙක්පත් වලින් රු. 7,000/- ක ( අංක 532457 ) චෙක්පත මාර්තු 31 වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

D. මාර්තු මස තැන්පත් කරන ලද රු. 2,000 ක චෙක්පත මාර්තු 31 වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

ඔබ විසින් ,

01. අදාල ගැලපීම් පෙන්වන ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුම

02. 2020 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය ( 2000 )

Question

2020 මාර්තු මාසයට අදාල බැංකු සැසදුම පිළියෙල කිරීමට ගණකාධිකාරිවරයා පහත සඳහන් තොරතුරු සොයාගන්නා ලදී.

2020 පෙබරවාරි මස 28 දිනට බැංකු අයිරාව රු. 200,000 විය.

වෙනත් තොරතුරු

- බැංකුවේ තැන්පත් කළ රු. 48,000 ක චෙක්පත් උපලබ්දි වී නොමැත.
- ඍජු ප්‍රේෂණ රු. 20,000 වේ.
- වෙළඳ ලැබිය යුතු දෑ එවූ රු. 50,000 ක චෙක්පත බැංකුවේ තැන්පත් කළද ඒ පිළිබඳ බැංකු ගිණුමේ සටහන් කොට නැත.
- රු. 10,000 ක වෙළඳ ගෙවිය යුතු දෑ නිකුත් කළ චෙක්පතක් තවම ගෙවීමට ඉදිරිපත් කර නොමැත.
- බැංකු ගාස්තු රු. 2,100 ක් ද අයකර ඇත.
- රු. 12,000 ක තැන්පත් කළ චෙක්පතක් අගරු කළද ඒ පිළිබඳ මුදල් පාලන ගිණුමේ සටහන් කර නැත.
- මාර්තු මස වෙළඳ ගෙවිය යුතු දෑ අත්තිකාරම් සඳහා නිකුත් කළ රු. 35,000 ක් රු. 40,000 ක් වටිනා චෙක්පත් දෙකෙන් බැංකුවට ඉදිරිපත් වී ඇත්තේ රු. 35,000 වටිනා චෙක්පත පමණි.මෙම චෙක්පත් දෙකම මුදල් පාලන ගිණුමේ සටහන් කර නොමැත.

අවශ්‍ය වන්නේ ,

01. සංශෝධිත බැංකු ගිණුම
02. බැංකු සැසදුම් ප්‍රකාශය

Question

සැම්ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසය සඳහා වාණිජ්‍ය බැංකුව විසින් එවා තිබූ බැංකු ප්‍රකාශනයේ සාරාංශය පහත දැක්වේ.

- බැංකු ප්‍රකාශනයේ බැර තීරුවේ එකතුව රු. 350,000
- බැංකු ප්‍රකාශනයේ හර තීරුවේ එකතුව රු. 300,000
- 2020 ජනවාරි 31 දිනට බැර ශේෂය රු. 50,000

අතිරේක තොරතුරු

- මුදල් ගිණුමේ බැර පැත්ත රු. 10,000 ක් අඩුවෙන් එකතු වී ඇති අතර බැංකුව අයකළ ගාස්තු රු. 150,000 ක් හා චෙක් පොත් ගාස්තු රු. 800 ක් මුදල් ගිණුමේ ඇතුලත්ව ඇත.
- බැංකුව විසින් වැරදීමකින් නිහාල් ගේ ගිණුමට හර කළ යුතු රු. 2,000 ගාස්තුව සාමාගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමට හර කර ඇත.
- 2019 දෙසැම්බර් 31 දිනට උපලබ්ධි නොවූ චෙක්පත් වල අගය රු. 60,000 ක් අතර මින් රු. 15,000 ක චෙක්පත් උපලබ්ධි වී ඇත්තේ පෙබරවාරි මාසයේදීය.
- 2019 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල අගය රු. 36,000 ක් වූ අතර ඉන් රු. 8,000 චෙක්පත් ඉදිරිපත් වී ඇත්තේ පෙබරවාරි මාසයේදීය.
- මුදල් ගිණුමේ සටහන් නොවූ ගනුදෙනු පහත පරිදි විය.

- සෘජු පේෂණ රු. 12,000
- ස්ථාවර නියෝග යටතේ ගෙවීම් රු. 16,000
- රක්ෂණ ගාස්තු රු. 12,000

- 2020 ජනවාරි 31 දිනට ජනවාරි තැන්පත් කළ චෙක්පත් වලින් රු. 34,000 ක් බැර නොවී ඇති අතර නිකුත් කළ චෙක්පත් වලින් රු. 32,000 වටිනා චෙක්පත් ගෙවීමට ඉදිරිපත් වී නැත.
- බැංකු ප්‍රකාශනයේ හර කිරීම් වල ආරම්භක බැංකු අයිරාව රු. 30,000 ක්ද ඇතුළත්ව ඇත.

අවශ්‍ය වන්නේ ,

01. 2020 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න.

Question

අමල්ගේ ව්‍යාපාරයේ තොරතුරු ,

අමල්ගේ ව්‍යාපාරයේ 2016 අප්‍රේල් මාසයට අදාලව මුදල් ලැබීම් ජර්නලය පහත දැක්වේ,

මුදල් ලැබීම් ජර්නලය

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | දුන් වට්ටම්(රු. ) | වටිනා කම (රු. ) | විශ්ලේෂණය (රු. ) | |
|---|---|---|---|---|---|---|
| | | | | | ණයගැති | විකුණුම් |
| 2016.04.05 | විකුණුම් | 147 585 | - | 16 000 | - | 16 000 |
| 2016.04.08 | චාමර | 218570 | 500 | 10 000 | 10 000 | - |
| 2016.04.10 | විකුණුම් | - | - | 5 000 | - | 5 000 |
| 2016.04.15 | මේනක | 412870 | 800 | 12 000 | 12 000 | - |
| 2016.04.20 | සම්පත් | 241711 | 300 | 8 000 | 8 000 | - |
| 2016.04.22 | රුවන් | 281620 | 700 | 15 000 | 15 000 | - |
| 2016.04.25 | සාගර | - | 1 000 | 19 000 | 19 000 | - |
| | | | 3 300 | 85 000 | 64 000 | 21 000 |

2016 අප්‍රේල් මාසයට අදාල මුදල් ගෙවීම් ජර්නලය පහත දැක්වේ

මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | ලැබූ වට්ටම් ( රු. ) | වටිනාකම ( රු. ) | විශ්ලේෂණ තීරු ( රු. ) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ණයහිමි | ගැනුම් | වියදම් | වෙනත් වියදම් |
| 2016.04.04 | ගැනුම් | 211010 | - | 6 000 | - | 6 000 | - | - |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2016.04.06 | සේනක | 211011 | 500 | 15 000 | 15 000 | - | - | - |
| 2016.04.08 | විදුලිය | 211012 | - | 6 000 | - | - | 6 000 | - |
| 2016.04.12 | කෝකිලා | 211013 | 1 000 | 18 000 | 18 000 | - | - | - |
| 2016.04.18 | සුළු මුදල් | 211014 | - | 2 000 | - | - | - | - |
| 2016.04.25 | ගැනිලි | 211015 | - | 5 000 | - | - | - | - |
| 2016.04.28 | ගෙවල් කුලී | 211016 | - | 6 000 | - | - | 6 000 | 2 000 |
| 2016.04.29 | ගැනුම් | 211017 | - | 4 000 | - | 4 000 | - | 5 000 |
| | | | 1 500 | 62 000 | 33 000 | 10 000 | 12 000 | 7 000 |

මුදල් පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 12 000 | ණයහිමි පාලන | 33 000 |
| ණයගැති පාලන ගිණුම | 64 000 | ගැනුම් | 1 000 |
| විකුණුම් | 21 000 | වියදම් | 12 000 |
| | | වෙනත් ගෙවීම් | 7 000 |
| | | 4/30 ශේෂය | 44 000 |
| | 97 000 | | 97 000 |

2016 අප්‍රේල් මාසය සඳහා බැංකුවෙන් ලද ගිණුම් ප්‍රකාශනය පහත දැක්වේ,

2016 අප්‍රේල් මාසය සඳහා බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර (රු. ) | බැර (රු. ) | ශේෂය ( රු. ) |
|---|---|---|---|---|
| 04/01 | ශේෂය | - | 16 000 | 12 000 |
| 04/08 | චෙක් 147585 | - | - | 28 000 |
| 04/10 | චෙක් 211010 | **6 000** | 5 000 | 22 000 |
| 04/10 | මුදල් | - | - | 27 000 |
| 04/12 | චෙක් 211011 | **15 000** | 12 000 | 12 000 |
| 04/15 | චෙක් 412870 | - | - | 24 000 |
| 04/16 | චෙක් 211013 | **18 000** | - | 6 000 |
| 04/18 | චෙක් 211014 | **2 000** | 10 000 | 4 000 |
| 04/20 | චෙක් 218570 | - | - | 14 000 |

| | | | | |
|---|---|---|---|---|
| 04/25 | චෙක් 211015 | **5 000** | 19 000 | 9 000 |
| 04/25 | මුදල් | - | - | 28 000 |
| 04/30 | චෙක් 211016 | **6 000** | - | 22 000 |
| | චෙක්පොත් ගාස්තු | **1 000** | 4 000 | 21 000 |
| | ලාභාංශ | - | | 25 000 |

ඉහත ඉදිරිපත් කර ඇති මුදල් පාලන ගිණුමේ හා බැංකු ප්‍රකාශනයේ අප්‍රේල් 30 වන දිනට ශේෂය අසමාන වීමට හේතු දක්වා ,

01. මුදල් පාලන ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම හා
02. බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න. ( උපුටා ගැනීම : ගිණුම්කරණය ගුරු මාර්ගෝපදේශය )

**Question**

සමනලගේ ව්‍යාපාරයේ 2019.12.31 මුදල් පාලන ගිණුමේ ශේෂයත් බැංකු ප්‍රකාශනයේ ශේෂයත් සමාන නොවීය. වෙනසට හේතු පහත දැක්වේ.

| | |
|---|---|
| ඉදිරිපත් නොවූ චෙක්පත් | 185 000 |
| බැර නොවූ චෙක්පත් | 150 000 |
| සෘජු ප්‍රේෂණ | 120 000 |
| ස්ථාවර නියෝග ගෙවීම් | 145 000 |

අවශ්‍ය දේ,

පහත එක් එක් ස්වාධීන අවස්ථා යටතේ මුදල් පොත සංශෝධනය මත ශේෂයහඳුනා ගැනීම හා බැංකු සැසඳුමක් සකස් කරන්න.

01. මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 80 000 ක් නම්,
02. මුදල් පාලන ගිණුමේ 1/31 අයිරාව රු. 110 000 නම්,
03. 12/31 බැංකු ප්‍රකාශනය අනුව ශේෂය රු. 150 000 නම් ,
04. බැංකු ප්‍රකාශනය අනුව අයිරාව රු. 125 000 නම්

**Question**

කුසුම්සිරිගේ ව්‍යාපාරයේ 2019.12.31 මුදල් පාලන ගිණුමේ ශේෂයත් බැංකු ප්‍රකාශනයේ ශේෂයත් සමාන නොවීය. වෙනසට හේතු පහත දැක්වේ.

| | |
|---|---|
| ඉදිරිපත් නොවූ චෙක්පත් | 625 000 |
| බැර නොවූ චෙක්පත් | 350 000 |

සෘජු ප්‍රේෂණ 170 000

ස්ථාවර නියෝග ගෙවීම් 135 000

අවශ්‍ය දේ,

පහත එක් එක් ස්වාධීන අවස්ථා යටතේ මුදල් පොත සංශෝධනය මත ශේෂය හඳුනා ගැනීම හා බැංකු සැසඳුමක් සකස් කරන්න.

01. මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 70 000 ක් නම්,
02. මුදල් පාලන ගිණුමේ 1/31 අයිරාව රු. 210 000 නම්,
03. 12/31 බැංකු ප්‍රකාශනය අනුව ශේෂය රු. 350 000 නම් ,
04. බැංකු ප්‍රකාශනය අනුව අයිරාව රු. 525 000 නම්

Question

සෝමසිරි ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මස මුදල් ලැබීම් ජර්නලය , මුදල් ගෙවීම් ජර්නලය හා මුදල් පාලන ගිණුම පහත දක්වා ඇත.

මුදල් ලැබීම් ජර්නලය ( රු. 000 )

| දිනය | ල.අංකය | විස්තරය | වෙ.අංකය | දුන් වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | වෙනත් ආදායම් | වෙනත් ලැබීම් |
| 1/5 | | මුදල් තැන්පතු | - | - | 140 | - | - | - | 140 |
| 1/8 | | ණයගැති - | 1100 | 24 | 216 | - | 216 | - | - |
| 1/10 | | සමන් | 2500 | - | 220 | 220 | - | - | - |
| 1/17 | | අත්පිට | 800 | 10 | 190 | - | 190 | - | - |
| 1/22 | | විකුණුම් | 1400 | - | 480 | - | - | 480 | - |
| | | ණයගැති | | | | | | | |
| | | නාමල් | | | | | | | |
| | | කුලී ආදායම් | | | | | | | |
| | | | | 34 | 1 246 | 220 | 406 | 480 | 140 |

මුදල් ගෙවීම් ජර්නලය ( රු. 000 )

| | | විස්තරය | | | | විශ්ලේෂණ තීරු |
|---|---|---|---|---|---|---|

JMC vLearning
"your virtual learning partner"

| දිනය | ව.අංකය | | වෙ.අංකය | ලද වට්ටම් | වටිනාකම | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වෙනත් වියදම් | වෙනත් ගෙවීම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1/5 | | අත්පිට ගැනුම් | 1050 | - | 300 | 300 | - | - | - |
| 1/10 | | ණයහිමි | 1051 | 40 | 360 | - | 360 | - | - |
| 1/13 | | සුනෙත් | 1052 | - | 48 | - | - | 48 | - |
| 1/17 | | ප්‍රචරණ වියදම් | 1053 | 18 | 162 | - | 162 | - | - |
| 1/20 | | ණයහිමි - | 1054 | - | 230 | 230 | - | - | - |
| 1/25 | | විපුල | 1055 | 4 | 420 | - | 220 | - | - |
| | | අත්පිට ගැනුම් | | | | | | | |
| | | ණයහිමි - | | | | | | | |
| | | සාමා | | | | | | | |
| | | | | 62 | 1520 | 530 | 742 | 48 | - |

මුදල් පාලන ගිණුම ( රු. 000 )

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 200 | ගැනුම් | 530 |
| මුදල් තැන්පතු | 140 | ණයහිමි | 342 |
| විකුණුම් | 220 | ප්‍රචාරණ වියදම් | 48 |
| ණයගැති පාලන | 406 | | |
| කුලී ආදායම් | 480 | | |
| ප/ගෙ/ශේෂය | 174 | | |
| | 1620 | | 1620 |

ජනවාරි මාසය සඳහා බැංකුවෙන් ලද ගිණුම් විස්තරය පහත දැක්වේ.

ජනවාරි මස බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 1/1 | ඉ/ ගෙ/ ශේෂය | - | - | 200 000 |
| 1/1 | ඉතුරුම් ගිණුමට මාරු | 100 000 | - | 100 000 |
| 1/7 | කිරීම් | - | 140 000 | 240 000 |
| 1/8 | මුදල් තැන්පතු | 300 000 | - | ( 60 000) |
| 1/11 | චෙක් (1050) | - | 216 000 | 156 000 |
| 1/13 | තැන්පතු (1 100) | - | 220 000 | 376 000 |
| 1/13 | තැන්පතු ( 2 500 ) | - | 50 000 | 426 000 |
| 1/14 | තැන්පතු | 360 000 | - | 66 000 |
| 1/15 | චෙක් ( 1051) | 84 000 | - | (18 000) |
| 1/16 | චෙක් ( 1052) | - | 190 000 | 172 000 |
| 1/20 | තැන්පතු (800 ) | 162 000 | - | 10 000 |
| 1/22 | චෙක් (1053) | - | 480 000 | 490 000 |
| 1/30 | තැන්පතු ( 1 400 ) | 10 000 | - | 480 000 |
| | බැංකු ගාස්තු | | | |

අතිරේක තොරතුරු

1. සෘජු ප්‍රේෂණ ලෙස රු. 50 000 ලැබී ඇත. ( අයිරා පහසුකම් බැංකුව ව්‍යාපාරයට අනුමත කර ඇතැයි සලකන්න.)
2. මුදල් පාලන ගිණුම සංශෝධනය කරමින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න.

## Question

දිසානායක ගේ ව්‍යාපාරයේ 2020 පෙබරවාරි මස මුදල් ලැබීම් ජර්නලය , මුදල් ගෙවීම් ජර්නලය හා මුදල් පාලන ගිණුම පහත දක්වා ඇත.

මුදල් ලැබීම් ජර්නලය ( රු. 000 )

| දිනය | ල.අංකය | විස්තරය | වෙ.අංකය | දුන් වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | වෙනත් ආදායම් | වෙනත් ලැබීම් |
| | | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2/5 | | ණයගැති - | 1412 | 40 | 360 | - | 360 | - | - |
| 2/12 | | කැළුම් | 2525 | - | 150 | - | - | 150 | - |
| 2/15 | | ලද කුලී | 1125 | 12 | 108 | - | 108 | - | |
| 2/22 | | ආදායම් | 412 | - | 180 | 180 | - | - | |
| | | ණයගැති - | | | | | | | |
| | | කසුන් | | | | | | | |
| | | අත්පිට | | | | | | | |
| | | විකුණුම් | | | | | | | |
| | | | | 52 | 798 | 180 | 468 | 150 | - |

මුදල් ගෙවීම් ජර්නලය ( රු. 000 )

| දිනය | ව.අංකය | විස්තරය | වෙ.අංකය | ලද වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වෙනත් වියදම් | වෙනත් ගෙවීම් |
| 2/5 | | ණයහිමි - | 1065 | 8 | 72 | - | 72 | - | - |
| 2/10 | | බාසුර | 1066 | - | 55 | 55 | - | - | - |
| 2/12 | | අත්පිට ගැනුම් | 1067 | 20 | 110 | - | 110 | - | - |
| 2/19 | | ණයහිමි - | 1068 | - | 70 | - | - | 70 | - |
| 2/27 | | අකලංක | 1069 | 10 | 100 | - | 100 | - | - |
| 2/30 | | නඩත්තු වියදම් | 1070 | - | 125 | 125 | - | - | - |
| | | ණයහිමි - | | | | | | | |
| | | ලක්මාල් | | | | | | | |
| | | අත්පිට ගැනුම් | | | | | | | |
| | | | | 38 | 532 | 180 | 282 | 70 | - |

JMC vLearning "your virtual learning partner"

මුදල් පාලන ගිණුම ( රු. 000 )

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 139 | ගැනුම් | 180 |
| විකුණුම් | 180 | ණයහිමි | 282 |
| ණයගැති | 468 | ප්‍රචාරණ වියදම් | 70 |
| කුලී ආදායම් | 150 | | |
| | | ප/ගෙ/ශේෂය 405 | |
| | 937 | | 937 |

පෙබරවාරි මාසය සඳහා බැංකුවෙන් ලද ගිණුම් විස්තරය පහත දැක්වේ.

පෙබරවාරි මස බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 2/1 | ශේෂය | - | - | ( 321 000) |
| 2/3 | චෙක් තැන්පතු ( 5621 ) | - | 190 000 | (131 000) |
| 2/6 | චෙක් තැන්පතු ( 4517 ) | - | 480 000 | 349 000 |
| 2/8 | චෙක් ( 1065 ) | 72 000 | - | 277 000 |
| 2/10 | චෙක් ( 1066 ) | 55 000 | - | 222 000 |
| 2/15 | තැන්පතු | - | 150 000 | 372 000 |
| 2/17 | ස්ථාවර නියෝග - | 20 000 | - | 352 000 |
| 2/23 | රක්ෂණය | 48 000 | - | 304 000 |
| 2/25 | චෙක් ( 1067) | - | 360 000 | 664 000 |
| 2/27 | චෙක් තැන්පතු ( 1412) | - | 150 000 | 814 000 |
| 2/28 | චෙක් තැන්පතු ( 2525) | 110 000 | - | 704 000 |
| 2/28 | චෙක් ( 1067) | 70 000 | - | 634 000 |
| 2/28 | චෙක් ( 1068) | 234 000 | - | 400 000 |
| | කල් බදු වාරික | | | |

අතිරේක තොරතුරු

01. ණයගැති උපුල් සෘජුවම මුදල් තැන්පත් කර ඇත.
02. ජනවාරි මස නිකුත් කළ පහත චෙක්පත් ජනවාරි මස මස ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නැත.
    චෙ / අංක 1064 - රු 48 000
    චෙ / අංක 1063 - රු. 162 000

03. ජනවාරි මස තැන්පත් කරන ලද පහත චෙක්පත් ජනවාරි මස නිෂ්කාශනය වී නැත.
    චෙක්/ අංක 2212 - රු . 190 000

චෙක් / අංක 1245 - රු. 420 000

පහත සඳහන් දෑ පිළියෙල කරන්න,

01. පෙබරවාරි මාසය සඳහා සංශෝධිත මුදල් පාලන ගිණුම
02. පෙබරවාරි මස බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න.

**Question**

සඳතරු වෙළඳ ව්‍යාපාරයේ 2020 මාර්තු මස මුදල් ලැබීම් ජර්නලය , මුදල් ගෙවීම් ජර්නලය හා මුදල් පාලන ගිණුම් පහත දක්වා ඇත.

මුදල් ලැබීම් ජර්නලය ( රු. 000 )

| දිනය | ල.අංකය | විස්තරය | චෙ.අංකය | දුන් වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | වෙනත් ආදායම් | වෙනත් ලැබීම් |
| 3/6 | | මුදල් තැන්පතු | - | - | 15 | - | - | - | 15 |
| 3/17 | | ණයගැති - මාලී | 2012 | 5 | 28 | - | 28 | - | - |
| 3/20 | | අත්පිට | 2321 | - | 23.25 | 23.25 | - | - | - |
| 3/25 | | විකුණුම් | 4541 | 8 | 11.25 | - | 11.25 | - | - |
| 3/29 | | ණයගැති - | 5512 | - | 47.5 | - | - | 47.5 | - |
| | | ශානි | | | | | | | |
| | | පොලී ආදායම් | | | | | | | |
| | | | | 13 | 125 | 23.25 | 39.25 | 47.5 | 15 |

මුදල් ගෙවීම් ජර්නලය ( රු. 000 )

| දිනය | ව.අංකය | විස්තරය | චෙ.අංකය | ලද වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වෙනත් වියදම් | වෙනත් ගෙවීම් |

JMC vLearning "your virtual learning partner"

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 3/1 | | අත්පිට ගැනුම් | 2250 | | 120 | 120 | - | - | - |
| 3/8 | | ණයහිමි මලිත් | 2251 | - | 35 | - | 35 | - | - |
| 3/13 | | රක්ෂණ වියදම් | 2252 | 25 | 65 | - | - | 65 | - |
| 3/15 | | ණයහිමි අමල් | 2253 | - | 85 | - | 85 | - | - |
| 3/23 | | අත්පිට ගැනුම් | 2254 | 10 | 56 | 56 | - | - | - |
| 3/28 | | ණයහිමි සමන් | 2255 | - | 30 | - | 30 | - | - |
| 3/29 | | ගැනිලි | 2256 | 5<br>- | 20 | - | - | - | 20 |
| | | | | 40 | 411 | 176 | 150 | 65 | 20 |

මුදල් පාලන ගිණුම ( රු. 000 )

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 150 | ගැනුම් | 176 |
| මු/තැන්පතු | 15 | ණයහිමි | 140 |
| විකුණුම් | 23.25 | කුලී | 70 |
| පොලී ආදායම් 47.5 | | | |
| ණයගැති 39.25 | | | |
| ප/ගෙ/ශේෂය 111 | | | |
| | 386 | | 386 |

JMC vLearning "your virtual learning partner"

මාර්තු මාසය අවසානයේ බැංකුවෙන් ලද ගිණුම් විස්තරය පහත දැක්වේ.

මාර්තු මස බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 3/1 | ශේෂය | - | - | ................. |
| 3/5 | ඉතුරුම් ගිණුමට මාරු | 100 000 | - | ................. |
| 3/8 | කිරීම් | - | 15 000 | ................. |
| 3/10 | මුදල් තැන්පතු | 240 000 | - | ................. |
| 3/13 | චෙක් තැන්පතු ( 2250 ) | - | 28 000 | ................. |
| 3/15 | චෙක් තැන්පතු ( 2012 ) | 35 000 | - | ................. |
| 3/18 | චෙක් ( 2251 ) | - | 35 000 | ................. |
| 3/20 | චෙක් ( 2251) | 45 000 | - | ................. |
| 3/22 | චෙක් ( 2248) | 1 000 | | ................. |
| 3/22 | අගරු ගාස්තු | - | 23 250 | ................. |
| 3/25 | චෙක් තැන්පතු ( 2321) | 80 000 | | ................. |
| 3/28 | බැංකු ණය වාරික | - | 100 000 | ................. |
| 3/30 | චෙක් තැන්පතු | 65 000 | - | ................. |
| 3/31 | චෙක් ( 2252) | 85 000 | - | |
| | චෙක් ( 2253) | | | |

අතිරේක තොරතුරු :

- චෙක් අංක 2250 බැංකුව නිවරදිව සටහන් කර ඇත.
- 3/28 ලද චෙක්පත ණයගැති සෘජු ප්‍රේෂණයකි.
- පෙබරවාරි මස නිකුත් කරන ලද චෙක් අංක 2248 රු. 45 000 ක චෙක්පත හා රු. 85 000 චෙක්පත පෙබරවාරි මස ගෙවීම සඳහා ඉදිරිපත් වී නොතිබුණි.

ඔබ විසින් ,

01. සංශෝධිත මුදල් පාලන ගිණුම හා බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කරන්න.

JMC vLearning
"your virtual learning partner"

**Question**

මනුෂ  වෙළඳ ව්‍යාපාරයේ 2020 පෙබරවාරි  මස මුදල් ලැබීම් ජර්නලය , මුදල් ගෙවීම් ජර්නලය හා මුදල් පාලන ගිණුම්  පහත දක්වා ඇත.

මුදල් ලැබීම් ජර්නලය (රු. 000 )

| දිනය | ල.අංකය | විස්තරය | වෙ.අංකය | දුන් වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | වෙනත් ආදායම් | වෙනත් ලැබීම් |
| 2/4 | | ණයගැති - | 123 | 10 | 100 | - | 100 | - | - |
| 2/10 | | සිල්වා | 2521 | - | 80 | - | - | 80 | - |
| 2/20 | | ලද කොමිස් | 4547 | 10 | 50 | - | 60 | - | - |
| 3/21 | | ණයගැති - | - | - | 80 | 80 | - | - | - |
| 3/29 | | අජිත් | 5512 | - | 120 | - | - | - | 120 |
| | | අත්පිට | | | | | | | |
| | | විකුණුම් | | | | | | | |
| | | මෝරථ | | | | | | | |
| | | විකුණුම් | | | | | | | |
| | | | | 20 | 430 | 80 | 160 | 80 | 120 |

JMC vLearning
"your virtual learning partner"

මුදල් ගෙවීම් ජර්නලය ( රු. 000 )

| දිනය | ව.අංකය | විස්තරය | වෙ.අංකය | ලද වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වෙනත් වියදම් | වෙනත් ගෙවීම් |
| 2/6 | | ණයහිමි - ප්‍රභාත් | 6380 | 20 | 180 | - | 180 | - | |
| 2/8 | | අත්පිට ගැනුම් | 6381 | - | 96 | 96 | - | - | |
| 2/11 | | ණයහිමි - නොයෙල් | 6382 | 5 | 75 | - | 75 | - | |
| 2/15 | | සේවක වැටුප් | 6383 | - | 88 | - | - | 88 | |
| 2/17 | | ණයහිමි - නෙළුම් | 6384 | 6 | 54 | - | 54 | - | |
| 2/24 | | අත්පිට ගැනුම් | 6385 | - | 22 | 22 | - | - | |
| | | | | 31 | 515 | 118 | 309 | 88 | |

මුදල් පාලන ගිණුම ( රු. 000 )

| | | | |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | 50 | ගැනුම් | 118 |
| විකුණුම් | 80 | ණයහිමි | 309 |
| කොමිස් ආදායම් | 80 | කුලී | 88 |
| ණයගැති | 150 | | |
| ප/ගෙ/ශේෂය | 155 | | |
| | 515 | | 515 |

පෙබරවාරි මාසය අවසානයේ බැංකුවෙන් ලද ගිණුම් විස්තරය පහත දැක්වේ.

JMC vLearning "your virtual learning partner"

පෙබරවාරි මස බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 2/1 | ශේෂය | - | - | 15 000 |
| 2/7 | චෙක් තැන්පතු ( 2850) | - | 70 000 | 85 000 |
| 2/12 | චෙක් තැන්පතු ( 3236 ) | - | 165 000 | 250 000 |
| 2/14 | චෙක් ( 6380 ) | 180 000 | - | 70 000 |
| 2/19 | චෙක් ( 6381) | 96 000 | - | (26 000) |
| 2/23 | මුදල් තැන්පතු | - | 400 000 | 374 000 |
| 2/18 | ස්ථාවර නියෝග | 160 000 | - | 214 000 |
| 2/20 | චෙක් ( 6378) | 80 000 | - | 134 000 |
| /22 | බැංකු ණය වාරික | 10 000 | - | 124 000 |
| 2/25 | චෙක් තැන්පතු ( 123) | - | 100 000 | 224 000 |
| 2/27 | චෙක් තැන්පතු (2521 ) | - | 80 000 | 304 000 |
| 2/27 | චෙක් ( 6382) | 75 000 | - | 229 000 |
| | | | | |

අතිරේක තොරතුරු

1 . ණයගැතියකු වන නිමල් සෘජුවම මුදල් තැන්පත් කර ඇත.

2 . ජනවාරි මස නිකුත් කළ පහත චෙක්පත් ජනවාරි මස ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් වී නොමැත.

චෙ/අංක 6378 රු. 80 000

චෙ / අංකය 6375 රු. 120 000

3 . ජනවාරි මස බැංකුවට තැන්පත් කල පහත චෙක්පත් ජනවාරි මස නිෂ්කාශනය වී නැත.

චෙක්පත් තැන්පතු ( 2850) රු. 70 000

චෙක්පත් තැන්පතු ( 3236) රු. 165 000

ඔබ විසින් ,

1. සංශෝධිත මුදල් පාලන ගිණුම හා පෙබරවාරි මස සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න.

JMC VLearning "your virtual learning partner"

Question

සපුමල්ගේ ව්‍යාපාරයේ 2020 මාර්තු මාසය සඳහා බැංකුව විසින් එවන ලද ගිණුම් ප්‍රකාශයේ සඳහන් වූ වාසි දායක ශේෂය රු. 150 000 ක් වූ නමුත් , පහත හේතුන් නිසා පාලන ගිණුමේ එදිනට පැවැති ශේෂය සමාන නොවීය.

I. තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් රු. 400 000
II. නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 200 000
III. මුදල් පාලන ගිණුමේ රු. 80 000 ක් ලෙස සටහන් වූ බැංකුවේ තැන්පත් කළ චෙක්පතේ නිවරදි වටිනාකම රු. 20 000 කි.
IV. ව්‍යාපාරයට අයත් නොවූ රු. 65 000 ක වටිනාකමක් බැංකුව විසින් ව්‍යාපාරයේ ගිණුමට හර කර තිබුණි.
V. මුදල් පාලන ගිණුමේ සටහන් නොවූ ස්තාවර නියෝග මත ගෙවන ලද රක්ෂණ වාරික රු. 12 000 කි.
VI. බැංකුව අයකරන ලද බැංකු හා වෙනත් ගාස්තු රු. 6 000 ක් වන අතර ණයගැති සෘජු ප්‍රේෂණ රු. 30 000 කි. මෙවා මුදල් පාලන ගිණුමේ සටහන් වී නැත.

අවශ්‍ය වන්නේ,

ඉහත තොරතුරු ඇසුරින් සංශෝධිත මුදල් පාලන ගිණුම හා මාර්තු මාසය සඳහා බැංකු සැසදුම් ප්‍රකාශය සකස් කරන්න.

Question

2020 ජනවාරි මාසය සඳහා උද්ධීපනගේ ව්‍යාපාරයේ බැංකු විස්තරයේ පැවැති ශේෂය රු. 500 000 ක වාසිදායක ශේෂයක් වූ අතර එදිනට මුදල් පාලන ගිණුමේ ශේෂය සමඟ සමාන නොවීය . වෙනසට හේතු ලෙස පහත සඳහන් දෑ හදුනාගෙන ඇත.

I. තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් රු. 750 000 ක් වූ අතර ඉන් රු. 150 000 ක් රනිල් ඉදිරිපත් කල චෙක්පතක් වූ අතර එය බැංකුව විසින් අඟරු කර තිබුණි. මෙය මුදල් පාලන ගිණුමේ සටහන් කර නොමැත.
II. නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 300 000 කි. මෙම චෙක්පත් වලින් රු. 75 000 ක චෙක්පතක් බැංකුව අඟරු කර තිබුණද මුදල් පාලන ගිණුමේ සටහන් කර නැත.
III. මුදල් පාලන ගිණුමේ රු. 40 000 ක් ලෙස සටහන් වූ බැංකුවේ තැන්පත් කළ චෙක්පතේ නිවරදි වටිනාකම රු. 4 000 කි.
IV. ව්‍යාපාරයට අයත් නොවූ රු. 15 000 ක වටිනාකමක් බැංකුව විසින් ව්‍යාපාරයේ ගිණුමට බැර කර තිබුණි.
V. මුදල් පාලන ගිණුමේ සටහන් නොවූ ස්තාවර නියෝග මත ගෙවන ලද විදුලි වියදම් රු. 8 000 කි.
VI. බැංකුව අයකරන ලද බැංකු ගාස්තු රු. 2 000 ක් වන අතර ණයගැති සෘජු ප්‍රේෂණ රු. 130 000 කි. මෙවා මුදල් පාලන ගිණුමේ සටහන් වී නැත.

IMC vLearning your virtual learning partner

අවශ්‍ය වන්නේ,

ඉහත තොරතුරු ඇසුරින් සංශෝධිත මුදල් පාලන ගිණුම හා මාර්තු මාසය සඳහා බැංකු සැසදුම් ප්‍රකාශය සකස් කරන්න.

Question

පහත සඳහන් එක් එක් අවස්ථාවන් යටතේ නාමල් සමාගමේ බැංකු සැසඳුම් ප්‍රකාශයන් පිළියෙල කරන්න.

| | මුදල් පාලන ගිණුමේ ශේෂය ( අයිරාව ) | බැංකු ප්‍රකාශනයේ ශේෂය ( අයිරාව ) | ඉදිරිපත් නොවූ චෙක් | බැර නොවූ චෙක් |
|---|---|---|---|---|
| 1 | 180 000 | ? | 85 000 | 90 000 |
| 2 | 225 000 | ? | 70 000 | - |
| 3 | (40 000) | ? | 110 000 | 60 000 |
| 4 | (75 000) | ? | 55 000 | 180 000 |
| 5 | ? | (12 000 ) | 15 000 | 25 000 |
| 6 | ? | (120 000) | 170 000 | 155 000 |
| 7 | ? | (30 000) | 210 000 | 185 000 |

Question

පහත සඳහන් එක් එක් අවස්ථාවන් යටතේ නාමල් සමාගමේ බැංකු සැසඳුම් ප්‍රකාශයන් පිළියෙල කරන්න.

| | මුදල් පාලන ගිණුමේ ශේෂය ( අයිරාව ) | බැංකු ප්‍රකාශනයේ ශේෂය ( අයිරාව ) | ඉදිරිපත් නොවූ චෙක් | බැර නොවූ චෙක් |
|---|---|---|---|---|
| 1 | (45 000 ) | ? | 10 000 | 185 000 |
| 2 | (125 000) | ? | 160 000 | 410 000 |
| 3 | (178 000) | ? | 190 000 | 58 000 |
| 4 | ? | ( 100 000) | 20 000 | 45 000 |
| 5 | ? | 90 000 | - | 20 000 |
| 6 | ? | 60 000 | 93 000 | 35 000 |
| 7 | ? | 150 000 | 450 000 | 12 000 |

## Question

පහත සඳහන් වන්නේ ජයමිණිගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මසය සඳහා මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් ජර්නලයේ සටහන් හා ජනවාරි මස වෙනුවෙන් බැංකු විස්තරය වේ.

මුදල් ලැබීම් ජර්නලය ( රු. 000 )

| දිනය | ල.අංකය | විස්තරය | වෙ.අංකය | දුන් වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | වෙනත් ආදායම් | වෙනත් ලැබීම් |
| 2/2 | | ස්ථාවර | - | - | 70 | - | - | - | 70 |
| 2/5 | | තැන්පතු | 5001 | 15 | 120 | - | 120 | - | - |
| 2/12 | | ණයගැති - | 2010 | 5 | 112 | - | 112 | - | - |
| 3/14 | | මහේෂ් | 7472 | - | 50 | 50 | - | - | - |
| 3/22 | | ණයගැති - | - | - | 120 | - | - | 120 | |
| | | සනත් | | | | | | | |
| | | අත්පිට | | | | | | | |
| | | විකුණුම් | | | | | | | |
| | | කුලී ආදායම් | | | | | | | |
| | | | | 20 | 472 | 50 | 232 | 120 | 70 |

මුදල් ගෙවීම් ජර්නලය ( රු. 000 )

| දිනය | ව.අංකය | විස්තරය | චෙ.අංකය | ලද වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වෙනත් වියදම් | වෙනත් ගෙවීම් |
| 2/6 | | කුලී - මෝටර් | 60 | - | 60 | - | - | 60 | |
| 2/8 | | රථ | 61 | - | 145 | - | - | 145 | |
| 2/11 | | වැටුප් | 62 | 5 | 140 | - | 140 | - | |
| 2/19 | | ණයහිමි - රසල් | 63 | - | 250 | 250 | - | -- | |
| 2/22 | | අත්පිට ගැනුම් | 64 | - | 135 | - | - | 135 | |
| | | වරිපනම් | | | | | | | |
| | | | | | | | | | |

2/1 මුදලක් පාලන ගිණුමේ ආරම්භක අවාසිදායක ශේෂය රු. ........................ කි.

පෙබරවාරි මාසය අවසානයේ බැංකුවෙන් ලද ගිණුම් විස්තරය පහත දැක්වේ.

පෙබරවාරි මස බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 2/1 | ශේෂය | - | - | ( 220 ) |
| 2/7 | චෙක් ( 58) | 90 | - | ............ |
| 2/12 | චෙක් ( 57 ) | 120 | - | .............. |
| 2/14 | චෙක් තැන්පතු ( 1201) | - | 170 | ............... |
| 2/19 | මුදල් තැන්පතු | - | 70 | ............. |
| 2/23 | ඉතිරිකිරීමේ ගිණුමෙන් | - | 55 | ............. |
| 2/18 | චෙක් ( 60) | 70 | - | .............. |
| 2/20 | බැංකු ණය වාරික | 45 | - | ................ |
| /22 | චෙක් ( 61 ) | 145 | - | .................. |
| 2/25 | චෙක් තැන්පතු (5001) | - | 120 | .............. |
| 2/27 | චෙක් ( 63) | 250 | - | .................... |
| 2/27 | චෙක් ( 63) | - | 250 | .................. |
| 2/27 | බැංකු ගාස්තු | 10 | - | ................. |
| | | - | | |

| | | | | |
|---|---|---|---|---|
| 2/28 | චෙක් තැන්පතු (2010 ) | | 112 | .................. |

අතිරේක තොරතුරු

1 . ණයගැතියකු වන නිමල් සෘජුවම මුදල් තැන්පත් කර ඇත.

2 . ජනවාරි මස නිකුත් කළ පහත චෙක්පත් ජනවාරි මස ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් වී නොමැත.

චෙ/අංක 58 රු. 90 000

චෙ / අංකය 57 රු. 120 000

3 . ජනවාරි මස බැංකුවට තැන්පත් කල පහත චෙක්පත් ජනවාරි මස නිෂ්කාශනය වී නැත.

චෙක්පත් තැන්පතු ( 1201) රු. 70 000

චෙක්පත් තැන්පතු ( 12310 ) රු. 140 000

ඔබ විසින් ,

1. සංශෝධිත මුදල් පාලන ගිණුම හා පෙබරවාරි මස සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න.

## කෙටි ප්‍රශ්ණ ( Short Questions )

01. ව්‍යාපාරයක මුදල් පාලන ගිණුමේ සටහන් කරන පහත සඳහන් එක් එක් ගනුදෙනුව සටහන් කිරීම වෙනුවෙන් උපයෝගී කරගන්නා මූලාශ්‍රා ලේඛනය සඳහන් කරන්න.

| ගනුදෙනුව | මූලාශ්‍රා ලේඛනය |
|---|---|
| A. චෙක්පත් නිකුත් කිරීම | ............................... |
| B. මුදල් / චෙක්පත් තැන්පත් කිරීම | ............................... |
| C. අගරු වූ නිකුත්කළ චෙක්පත් | ............................... |
| D. අගරු වූ තැන්පත් කළ චෙක්පත් | ................................ |
| E. බැංකු ගාස්තු | ................................ |
| F. සෘජු ප්‍රේෂණ | ................................ |
| G. ස්ථාවර නියෝග ගෙවීම් | ................................ |

02. මුදල් පාලන ගිණුමේ ශේෂය හා බැංකු විස්තරය අනුව ශේෂය අසමාන වන විට මුදල් පාලන ගිණුමේ සංශෝධනය සඳහා යොදා නොගන්නා එහෙත් ශේෂ අසමාන වීමටබලපාන්නාවූ හේතු දෙකක් සඳහන් කරන්න.

A. ........................................................................................................................................

B. ........................................................................................................................................

C. ........................................................................................................................................

03. ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය අසමාන වීමට බලපාන හේතුන් දක්වා උදාහරණ දෙන්න.

A. ........................................................................................................................................
........................................................................................

B. ........................................................................................................................................
........................................................................................

C. ........................................................................................................................................
........................................................................................

04.

JMC vLearning "your virtual learning partner"